# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 පෙබරවාරි මස 07 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 පෙබරවාරි මස 11 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 50.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 20.00 යි.**

## 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 පෙබරවාරි මස 07 වන දින]

එල්.ඩී.—ඕ. 13/2010.

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 2000 අංක 43 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ;" සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "මේ පනතේ උපලේඛනයෙහි " යන වචන වෙනුවට "මේ පනතේ පළමුවන උපලේඛනයෙහි " යන වචන ආදේශ කිරීමෙන්.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) අලාභ ගැලපුම්කරුවන් වශයෙන් තැනැත්තන් ලියාපදිංචි කිරීම" ; සහ

(2) ඒ වගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඈඈ) යම් දේශීය හෝ විදේශීය තැනැත්තකු සමග තොරතුරු හුවමාරු කර ගැනීමට අදාළව කිසියම් ද්විපාර්ශ්වික හෝ බහුපාර්ශ්වික අවබෝධතා ගිවිසුමකට ඇතුළත් වීම;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) මේ පනතේ 14, 81, 83 සහ 89ඇ වගන්ති යටතේ ගාස්තු වශයෙන් ගෙවිය යුතු සියලු මුදල් ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට :—

(අ) ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද තැනැත්තකු ලෙස ; සහ

(ආ) රක්ෂණ ව්‍යාපාරය කරගෙන යෑම සඳහා මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරන ලද රක්ෂකයකු ලෙස

සැලකිය යුතු ය";

(2) එහි (2) වන උපවගන්තියේ "දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා හෝ සාමාන්‍ය හා දීර්ඝ කාලීන යන දෙවර්ගයේම රක්ෂණ ව්‍යාපාර සඳහා" යන වචන වෙනුවට "දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි (3) වන උපවගන්තියේ "1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද සමාජ ආරක්ෂණ මණ්ඩලය සහ 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "සහ 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද සමාජ ආරක්ෂණ මණ්ඩලය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (ආ) ඡේදයේ "නියමිත මුදලට අඩු" යන වචන වෙනුවට "තත්කාර්යය සඳහා සාදන ලද රීති මගින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් මුදලකට අඩු," යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති නුසුදුසුකම් එකකට හෝ ඊට වැඩි ගණනකට යටත් නොවන තැනැත්තන් ඇත්නම් ;".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (ඌ) ඡේදයේ "ප්‍රකාශයක් ; සහ", යන වචන වෙනුවට "ප්‍රකාශයක් ;" යන වචනය ආදේශ කිරීමෙන් ;

(2) එහි (එ) ඡේදයේ "ව්‍යාපාර සැලැස්මක් ", යන වචන වෙනුවට "ව්‍යාපාර සැලැස්මක් ; සහ " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එහි (එ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඒ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් ලේඛන සහ තොරතුරු.".

ප්‍රධාන ප්‍රඥප්තියට 15අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 15අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"රක්ෂණකරුවකු බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත විය යුතු බව.

15අ. මේ පනතේ 15 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් වසර තුනක කාලයක් ඇතුළත සෑම රක්ෂණකරුවකු විසින් ම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක තමන් ලැයිස්තුගත වී සිටිය යුතු වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ඉවත් කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (උ) ඡේදයේ "දෙන ලද යම් විධානයක්", යන වචන වෙනුවට "දෙන ලද යම් විධානයක් හෝ කරන ලද යම් නිශ්චය කිරීමක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (ඌ) ඡේදයේ "ලියාපදිංචි කිරීම සඳහා වූ ස්වකීය ඉල්ලීමෙහි" යන වචන වෙනුවට "ලියාපදිංචි කිරීම සඳහා වූ ස්වකීය ඉල්ලීමෙහි හෝ මණ්ඩලය වෙත භාරදෙන ලද තොරතුරු කිසිවක හෝ ලේඛන කිසිවක" යන වචන ආදේශ කිරීමෙන් ;

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ඉවත් කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 31අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියට 31අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ඇතැම් අවස්ථාවන්හි දී රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම හෝ කටයුතු කිරීම සඳහා කිසිදු තැනැත්තකු පත් කරනු නොලැබිය යුතු බව.

31අ. යම් තැනැත්තකු මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති නුසුදුසුකම්වලින් එකකට හෝ ඊට වැඩි ගණනකට යටත් වන අවස්ථාවක දී, ඒ තැනැත්තා රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම, තෝරා පත් කිරීම හෝ නම් කිරීම හෝ රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කරගෙන යාම නොකළ යුතු ය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1අ) මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් නුසුදුසුකම්, (1) වන උපවගන්තිය යටතේ නිශ්චිත නිලධරයකු වශයෙන් සේවයේ නියුතු තැනැත්තකුට ඒ සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 33අ, 33ආ, 33ඇ, 33ඈ සහ 33ඉ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියට 33අ, 33ආ, 33ඇ, 33ඈ සහ 33ඉ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයන් පත් කිරීමට අදාළ කොන්දේසි.

33අ. (1) යම් රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු හෝ සේවා නියුක්තයකු, වෙනත් රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම, තෝරා පත් කිරීම හෝ නම් කිරීම, එකී වෙනත් රක්ෂණකරු පළමුව සඳහන් කළ රක්ෂණකරුගේ පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් වන්නේ නම් මිස, නොකළ යුතු ය.

(2) රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබිය හැකි, තෝරා පත් කර ගනු ලැබිය හැකි හෝ නම් කරනු ලැබිය හැකි සේවානියුක්තයන් සංඛ්‍යාව එම රක්ෂණකරුගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට වඩා වැඩි නොවිය යුතු ය යන

කොන්දේසියට යටත්ව, යම් රක්ෂණකරුවකුගේ සේවානියුක්තයකු ඒ රක්ෂණකරුගේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම, තෝරාපත් කිරීම හෝ නම් කිරීම කරනු ලැබිය හැකි ය.

"අධ්‍යක්ෂවරුන්ගේ යෝජිත පත්කිරීම්, නම් කිරීම හෝ තෝරා පත්කර ගැනීම් පිළිබඳව රක්ෂණකරු විසින් මණ්ඩලයට දැනුම් දිය යුතු බව.

33ආ. (1) රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමට, තෝරා පත් කිරීමට හෝ නම් කිරීමට අදහස් කරනු ලබන එක් එක් තැනැත්තන් පිළිබඳ තොරතුරු දැනුම්දෙමින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු පරිදි යම් ආකෘතියකින් සහ ආකාරයකින් වූ දැන්වීමක් සමාගම් රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා වෙත ගොනු කරනු ලබන ආකෘතිය සමගින්, සෑම රක්ෂණකරුවකු විසින් ම, අවස්ථාවෝචිත පරිදි, ඒ පත් කිරීම, තෝරා පත් කිරීම හෝ නම් කිරීම සිදු කිරීමට පෙරාතුව, මණ්ඩලය වෙත භාර දිය යුතු අතර, ඒ සඳහා මණ්ඩලයේ අනුමතය ලබා ගත යුතු ය.

(2) රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු ලෙස යම් තැනැත්තකුගේ යෝජිත පත් කිරීමක්, තෝරා පත් කිරීමක් හෝ නම් කිරීමක් පිළිබඳව (1) වන උපවගන්තිය යටතේ ඒ රක්ෂණකරුගෙන් මණ්ඩලය වෙත දැන්වීමක් ලැබුණු අවස්ථාවක දී, මණ්ඩලය විසින් ඒ දැන්වීම ලැබී දින තිහක් ඇතුළත, මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති නුසුදුසුකම් සහ 33අ වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, අවස්ථාවෝචිත පරිදි, ඒ පත්කිරීම, තෝරා පත් කිරීම හෝ නම් කිරීම, අනුමත කිරීම හෝ අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීම කළ යුතු අතර, එම තීරණයට එළඹීමේ දී හේතු වූ කාරණා සමගින් මණ්ඩලයේ තීරණය පිළිබඳව රක්ෂණකරුට දැනුම්දිය යුතු ය. අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමට, තෝරා පත් කිරීමට හෝ නම් කිරීමට අදහස් කරනු ලැබූ තැනැත්තා වෙත ද මණ්ඩලයේ තීරණය පිළිබඳව දැනුම් දීම රක්ෂණකරුගේ කාර්යය විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ලබා දුන් තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එම තීරණයට එරෙහිව මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර,

මණ්ඩලය විසින් එම අභියාචනය, රක්ෂණය, මූල්‍ය කළමනාකරණය හෝ නීතිය යන ක්ෂේත්‍රවල පළපුරුද්දක් ඇති සහ හැකියාවක් පෙන්වා ඇති තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් තුන්දෙනෙකුගෙන් සමන්විත සමාලෝචන මූල මණ්ඩලයක් වෙත, ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. සමාලෝචන මූල මණ්ඩලය විසින්, එකී අභියාචනය සිදුකර ඇත්තේ යම් කරුණු මත ද, එම කරුණු සහ සමාලෝචන මූල මණ්ඩලය විසින් ස්වකීය මතය අනුව සැලකිල්ලට ගැනීමට යෝග්‍ය යයි සිතෙන වෙනත් යම් කරුණු ද සැලකිල්ලට ගනිමින්, එම තැනැත්තා අදාළ රක්ෂණකරුගේ අධ්‍යක්ෂවරයකු වශයෙන් අවස්ථාවෝචිත පරිදි, පත්කිරීම, තෝරා පත් කිරීම හෝ නම් කිරීම, ප්‍රතික්ෂේප කිරීම සනාථ කරමින්, නැතහොත් එම පත්කිරීම, තෝරාපත් කිරීම හෝ නම් කිරීම අනුමත කරමින්, තීරණයක් කරනු ලැබිය යුතු ය.

රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරුන්ගේ පත්කිරීම, තෝරාපත් කිරීම හෝ නම් කිරීම මණ්ඩලය විසින් අනුමත කළ යුතු බව.

33ඇ. (1) මේ පනතේ 33ආ වගන්තිය යටතේ පත් කිරීම, තෝරා පත්කිරීම හෝ නම් කිරීම මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ නොමැති තැනැත්තකු, රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු ලෙසින් ඒ රක්ෂණකරු විසින් පත්කිරීම, තෝරා පත් කිරීම හෝ නම් කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 33ආ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අනුමතය සඳහා මණ්ඩලයට නම දී ඇති තැනැත්තකු, මණ්ඩලයේ තීරණය ලැබෙන තෙක් රක්ෂණකරුගේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීම, තෝරා පත්කිරීම හෝ නම් කිරීම කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, මණ්ඩලය සිය අනුමතය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී සහ රක්ෂණකරු විසින් අදාළ තැනැත්තාට මණ්ඩලයේ තීරණය දැනුම් දෙන අවස්ථාවක දී, මණ්ඩලයේ අනුමතය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමේ තීරණයට එරෙහිව 33ආ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අදාළ තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබ තිබිය හැකි විරෝධතා කිසිවක් පිළිබඳව මණ්ඩලය විසින් විමසා බලා එළඹෙන යම් තීරණයකට යටත්ව, ඒ

දැනුම් දීම කරනු ලැබූ දිනයේ සිට ඒ තැනැත්තා විසින් රක්ෂණකරුගේ අධ්‍යක්ෂවරයකු ලෙස ධුර දැරීම අවසන් කළ යුතු ය.

(3) මණ්ඩලය විසින්, අවස්ථාවෝචිත පරිදි, පත් කිරීම, තෝරා පත්කිරීම හෝ නම් කිරීම අනුමත කරනු ලැබූ සෑම අධ්‍යක්ෂවරයකුගේ පත්කිරීමක්, තෝරා පත් කිරීමක් හෝ නම් කිරීමක් පිළිබඳ වහාම මණ්ඩලය වෙත දැනුම් දීම, රක්ෂණකරුවකුගේ කාර්යය වන්නේ ය.

අධ්‍යක්ෂවරයකු ලෙස ධුර දැරීමට නුසුදුසු තැනැත්තකු අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් කිරීම.

33ඇ. (1) රක්ෂණකරුවකු විසින්, එම රක්ෂණකරුගේ අධ්‍යක්ෂවරයකු මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති නුසුදුසුකම් කිසිවකින් එකකට හෝ ඊට වැඩි ගණනකට යටත් වී ඇති බවට හෝ ඒ රක්ෂණකරුගේ අධ්‍යක්ෂවරයකු ලෙස අඛණ්ඩව ධුරය දැරීමට යෝග්‍ය නොවන තත්ත්වයට පත් වී ඇති බවට දැනගන්නට ලැබුණු වහාම, ඒ පිළිබඳව මණ්ඩලයට දැනුම් දිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් අධ්‍යක්ෂවරයකු පිළිබඳ කිසියම් තොරතුරක් මණ්ඩලය වෙත ලැබුණු අවස්ථාවක දී හෝ රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කර, තෝරා පත් කර හෝ නම් කර ඇති යම් තැනැත්තකු ඉන්පසුව මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති නුසුදුසුකම් කිසිවකින් එකකට හෝ ඊට වැඩි ගණනකට යටත් වී ඇති බවට හෝ රක්ෂණකරුගේ අධ්‍යක්ෂවරයකු ලෙස අඛණ්ඩව ධුරය දැරීමට නොහැකි බවට පත්ව ඇතැයි මණ්ඩලය කවර හෝ අවස්ථාවක දී දැනුවත් වන අවස්ථාවක දී, මණ්ඩලය විසින් —

(අ) යම් විධානයක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ දී අධ්‍යක්ෂ ධුරයෙන් ඒ තැනැත්තා ඉවත් කිරීමට අදාළ රක්ෂණකරු වෙත ලිඛිතව විධාන කළ යුතු ය ; සහ

(ආ) ඒ ඉවත් කිරීම පිළිබඳව ඉවත් කරනු ලබන තැනැත්තාට, රක්ෂණකරු වෙත නිකුත් කරන ලද විධානයේ පිටපතක් ද සමග ලිඛිතව දැනුම් දිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ විධානයක් නිකුත් කරනු ලැබුවේ යම් රක්ෂණකරුවකු වෙත ද, ඒ රක්ෂණකරු විසින් විධානයේ නිශ්චිතව සඳහන් කරන ලද කාලසීමාව තුළ දී—

(අ) අධ්‍යක්ෂ ධුරයෙන් ඒ තැනැත්තා ඉවත් කළ යුතු ය ; එමෙන් ම

(ආ) ඒ ඉවත් කිරීම පිළිබඳව රක්ෂණකරුගේ කොටස් හිමියන් හට සහ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට දැන්වීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

(4) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නිකුත් කරන ලද විධානයකට අනුකූලව අධ්‍යක්ෂවරයකුගේ ඉවත් කිරීම, රක්ෂණකරුගේ සමාගම් ව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුව ද, රක්ෂණකරු විසින් යවන ලද ඉවත් කිරීම පිළිබඳ දැන්වීම අධ්‍යක්ෂවරයා වෙත ලැබුණු දින සිට බලාත්මක විය යුතු ය.

(5) මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ධුරයෙන් යම් තැනැත්තකු ඉවත් කිරීමේ දී එයින් අතෘප්තියට පත් ඒ තැනැත්තා විසින්, ඒ ඉවත් කිරීම පිළිබඳ දැනුම් දීමෙන් දින දාහතරක් ඇතුළත ඒ පිළිබඳව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඒ අභියාචනය කරනු ලැබුවේ යම් තීරණයකට එරෙහිව ද, ඒ තීරණය අභියාචනාධිකරණය විසින් ස්ථිර කිරීම, ප්‍රතිශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ බැහැර කිරීම කරනු ලැබිය හැකි අතර, යුක්තිය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් නියමයක් ද කරනු ලැබිය හැකි ය.

33ඉ. 33ඈ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ දෙන ලද කිසියම් විධානයකට ඒ විධානයේ නිශ්චිතව සඳහන් කරන ලද කාලසීමාවක් තුළ දී අනුකූලවීමට අපොහොසත් වන යම් රක්ෂණකරුවකු සහ ඒ උපවගන්තියේ (ආ) ඡේදය යටතේ දැන්වීමක් භාර දී ඇති අධ්‍යක්ෂවරයකු විසින්, ඉන්පසුවත් අධ්‍යක්ෂවරයකු ලෙස තවදුරටත් ක්‍රියාකරන තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට සහ ඊට අමතරව—

(අ) රක්ෂණකරුවකු සම්බන්ධයෙන් වන විට දී වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද තවදුරටත් සිදුකරන එක් එක් දිනය වෙනුවෙන්, රුපියල් ලක්ෂයක වැඩිදුරටත් වූ දඩ මුදලකට ; සහ

(ආ) රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු සම්බන්ධයෙන් වන විට දී, වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂවරයකු ලෙසින් තවදුරටත් කටයුතු කරන එක් එක් දිනය වෙනුවෙන්, රුපියල් ලක්ෂයකට වැඩිදුරටත් වූ දඩ මුදලකට,

යටත් විය යුතු ය.”.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය ඉවත් කිරීම.*

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“(1) සෑම රක්ෂණකරුවකු විසින් ම, රක්ෂණ ඔප්පු දරන්නන්ගේ සුභ සිද්ධිය ප්‍රමාණවත් ලෙස සුරක්ෂිත වන්නේ ද යන්න පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා :—

(අ) එකී රක්ෂණකරු විසින් නිකුත් කරනු ලැබිය යුතු සියලු රක්ෂණ ඔප්පු ආකෘති නිකුත් කිරීමට පෙරාතුව ;

(ආ) දැනටමත් නිකුත් කර ඇති යම් රක්ෂණ ඔප්පු ආකෘතිපත්‍රවලට සිදු කරනු ලබන යම් සංශෝධන ; සහ

(ඇ) ලිඛිතව කරන ලද නිවේදනයක් මගින් එසේ කරන ලෙස නියම කිරීමේ දී, දැනටමත් නිකුත් කර ඇති රක්ෂණ ඔප්පු ආකෘතිපත්‍රවල පිටපත්,

මණ්ඩලය වෙත ගොනු කිරීම කරනු ලැබිය යුතු ය.".

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා සාදනු ලබන රීති මගින් ", යන වචන වෙනුවට "මණ්ඩලය විසින් " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා සාදනු ලබන රීති මගින් නියම කර ඇති ", යන වචන වෙනුවට "මණ්ඩලය විසින් නියම කර ඇති " යන වචන ආදේශ කිරීමෙන්.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "තත්කාර්යය සඳහා මණ්ඩලය විසින් සාදන ලද රීතිවලට අනුකූලව උද්ධෘතයක්" යන වචන වෙනුවට, "උද්ධෘතයක් යම් ආකාරයකින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ (ආ) ඡේදයේ "තත්කාර්යය සඳහා සාදන ලද රීති මගින් නිශ්චය කරනු ලබන යම් තොරතුරු" යන වචන වෙනුවට, "මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් තොරතුරු සහ ඒ තොරතුරු සැපයිය යුතු කාලසීමාව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ "1982 අංක 17 දරන සමාගම් පනතේ 162 වන වගන්තියේ විධිවිධාන", යන වචන වෙනුවට, "2007 අංක 7 දරන සමාගම් පනතේ 173 වන වගන්තියේ විධිවිධාන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ "තත්කාර්යය සඳහා මණ්ඩලය විසින් සාදනු ලැබූ රීති මගින් නිශ්චය කරනු ලබන පරිදි" යන වචන වෙනුවට, "මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමා තුළ දී" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියේ අතුරු විධානයේ "යම් නිශ්චිත රක්ෂකයකු" සහ "ඒ රක්ෂණකරුට" යන වචන වෙනුවට, පිළිවෙලින් "යම් නිශ්චිත රක්ෂකයකු හෝ තැරැව්කරුවකු" සහ "ඒ රක්ෂණකරුට හෝ තැරැව්කරුට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මණ්ඩලයට ඉදිරිපත් කරන ලද වාර්තා ප්‍රසිද්ධ කිරීම.

61. රක්ෂණකරුවකු විසින් මේ පනත යටතේ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද යම් වාර වාර්තාවක් හෝ එම වාර වාර්තාවේ සත්‍ය වූ ද නිවැරදි වූ ද උද්ධෘතයක්, මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව ප්‍රචාරය කිරීමේ කාර්යය සඳහා ප්‍රසිද්ධ කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් පුද්ගලයකු" සහ "සියලු පුද්ගලයන්" යන වචන වෙනුවට, පිළිවෙලින් "යම් තැනැත්තකු" සහ "සියලු තැනැත්තන් " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "යම් පුද්ගලයකු" යන වචන වෙනුවට, "යම් තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "රක්ෂණ ඔප්පුවක් හෝ ඔප්පු" යන වචන වෙනුවට, "රක්ෂණ ඔප්පු" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ —

(අ) (i) වන අනුඡේදයේ "නිශ්චිත නිලධරයකු" යන වචන වෙනුවට "ප්‍රධාන නිලධරයකු" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (ii) වන අනුඡේදයේ "ආශ්‍රිත සමාගමක හෝ පාලිත සමාගමක" යන වචන වෙනුවට, "ආශ්‍රිත සමාගමක, පාලිත සමාගමක හෝ පාලක සමාගමක" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (ඇ) ඡේදයේ (iii) වන අනුඡේදයේ "80 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ" යන වචන වෙනුවට, "80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (ඌ) ඡේදයේ "වෘත්තීය හානිපූරණ රක්ෂණ ඔප්පුවේ හෝ ඔප්පුවල සහතික පිටපතක්;", යන වචන වෙනුවට, "වෘත්තීය හානිපූරණ රක්ෂණ ඔප්පුවල එක් එක් සහතික පිටපතක්;" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "තත්කාර්යය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත" යන වචන වෙනුවට, "එම ලියාපදිංචි කිරීමේ සහතිකය ඉකුත්වීමට පෙර මාස තුනකට වැඩි නොවන එහෙත් මාස දෙකකට අඩු නොවන කාලයක් ඇතුළත, තත්කාර්යය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (අ) ඡේදයේ "ඉදිරිකාලය සඳහා වෘත්තීය හානිපූරණ රක්ෂණ ඔප්පුවක්;", යන වචන වෙනුවට, "ඉදිරි කාලය වෙනුවෙන්, රක්ෂණකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් නිකුත් කළ එක් එක් වෘත්තීය හානිපූරණ රක්ෂණ ඔප්පුවල සහතික පිටපතක් ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "වෙනත් ලේඛන,", යන වචන වෙනුවට, "වෙනත් ලේඛන සහ තොරතුරු,", යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 84 වන වගන්තිය ඇතුළත් කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ —

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) තැරැව්කරු මණ්ඩලය විසින් මේ පනත යටතේ නිකුත් කරන ලද යම් විධානයන්ට අනුකූලවීමට අපොහොසත් වන හෝ ඒවාට විරුද්ධව ක්‍රියාකරන;";

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) තැරැව්කරු හොඳ මූල්‍ය ස්ථාවරත්වයක සිටීම නැවතී ඇති;";

(ඇ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) (i) තැරැව්කරුගේ අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන නිලධරයා ; හෝ

(ii) ඒ තැරැව්කරුගේ ආශ්‍රිත හෝ පාලිත හෝ පාලක සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයකු,

රක්ෂණකරුගේ අධ්‍යක්ෂවරයකු හෝ කොටස් හිමියකු හෝ සේවා නියුක්තයකු වන;";

(ඇ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදයන් ඇතුළත් කිරීමෙන් :—

"(ඇඇ) තැරැව්කරුවකු කිසියම් රක්ෂණකරුවකුගේ කොටස්කරුවකු වන ;

(ඇඇඇ) මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ මේ පනත යටතේ සාදන ලද කිසියම් නියෝගයක් හෝ රීතියක් හෝ මණ්ඩලය විසින් පනවන ලද කිසියම් කොන්දේසියක් තැරැව්කරුවකු විසින් උල්ලංඝනය කර තිබෙන;"; සහ

(ඉ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඉ) තැරැව්කරුවකු විසින් අසත්‍ය, නොමග යවන සුලු හෝ නිවැරදි නොවන්නා වූ තොරතුරු සපයා ඇති හෝ අවස්ථාවෝචිත පරිදි, ලියාපදිංචි කිරීම සඳහා හෝ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍රයක හෝ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද යම් ප්‍රකාශයක හෝ ලේඛනයක අවශ්‍ය කරුණු හෙළිදරව් කිරීම සඟවා සිටි හෝ අපොහොසත්ව ඇති ;" සහ

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1අ) මේ පනතේ 18 වන වගන්තියේ (2), (3), (4), (5), (6) සහ (7) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමක්, අවලංගු කිරීමක්, හෝ අත්හිටුවීමක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය."; සහ

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "විධිවිධාන ඒ අභියාචනය සම්බන්ධයෙන්," යන වචන වෙනුවට "විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ අභියාචනය සම්බන්ධයෙන්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 84අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 84අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"84 වන වගන්තිය යටතේ ක්‍රියාකිරීම වෙනුවට මණ්ඩලය විසින් ඇතැම් පියවරවල් ගැනීමට නියම කරනු ලැබිය හැකි බව.

84අ. 84 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එහි සඳහන් කරුණු එකක් හෝ ඊට වැඩි ගණනක් මත ඒ වගන්තිය යටතේ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම වෙනුවට සහ ඒ වගන්තිය යටතේ ක්‍රියාමාර්ගයක් ගැනීමට අවසරදීමට තරම් අදාළ ක්‍රියාව හෝ නොකර හැරීමේ ස්වභාවය වැදගත් නොවන අවස්ථාවක දී—

(අ) එම ක්‍රියාවෙන් හෝ නොකර හැරීමෙන් උද්ගත වන යම් ප්‍රතිඵලයක් නිවැරදි කිරීම සඳහා සහ නිවැරදි ආකාරයකට සකස් කිරීම සඳහා ; සහ

(ආ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝග හෝ රීති කිසිවක් හෝ මේ පනත යටතේ මණ්ඩලය විසින් පනවන ලද කොන්දේසි හෝ දෙන ලද නියෝග කිසිවක් හා අනුකූලවීම සඳහා,

මණ්ඩලය විසින් සුදුසු යයි තීරණය කරනු ලැබිය හැකි යම් පියවර ගැනීමට, තැරැව්කරුට නියම කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "මණ්ඩලය විසින් අනුමත කරන ලද ලියාපදිංචි රක්ෂණකරුවන් දෙදෙනකුගෙන් හෝ ඊට වැඩි ගණනකින්,", යන වචන වෙනුවට, "රක්ෂණකරුවන් දෙදෙනකුගෙන් හෝ ඊට වැඩි ගණනකින්," යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ සහ ඒ උපවගන්තියේ අතුරුවිධානයේ "ඒ රක්ෂණ ඔප්පුව" සහ "රක්ෂණ ඔප්පුව" යන වචන වෙනුවට, පිළිවෙලින් "ඒ රක්ෂණ ඔප්පු" සහ "රක්ෂණ ඔප්පු" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ —

(අ) "ලබාගන්නා ලද රක්ෂණ ඔප්පුවක්", යන වචන වෙනුවට, "ලබාගන්නා ලද රක්ෂණ ඔප්පු" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) "සඳහා, වගකීමෙන් නිදහස් කිරීමේ අවම සීමාවක්", වෙනුවට, "යන මෙයින් වඩා වැඩි මුදලක් සඳහා වගකීමෙන් නිදහස් කිරීමේ අවම සීමාවක්" යන වචන ආදේශ කිරීමෙන්.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) සෑම තැරැව්කරුවකු විසින් ම මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් තොරතුරු ඇතුළත් සහ එසේ නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් තුළ දී වාර වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය."; සහ

(2) එම වගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(6) සෑම තැරැව්කරුවකු විසින් ම, මේ පනතේ 83 වන වගන්තිය මගින් නියම කර ඇති පරිදි රක්ෂණකරුවන් දෙදෙනෙක් හෝ ඊට වැඩි ගණනක් විසින් නිකුත් කරන ලද එක් එක් වෘත්තීය හානිපූරණ රක්ෂණ ඔප්පුවල සහතික පිටපත්, වාර්ෂිකව මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තියේ "රක්ෂණකරුවකු විසින් ඒ තැරැව්කරුට හෝ රක්ෂණ නියෝජිතයාට ගෙවනු ලැබිය හැකි ", යන වචන වෙනුවට, "රක්ෂණකරුවකු විසින් ඒ ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම.

තැරැව්කරුට හෝ රක්ෂණ නියෝජිතයාට හෝ තැරැව්කරුවකු විසින් රක්ෂණ නියෝජිතයකුට ගෙවනු ලැබිය හැකි" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට VIIIඅ කොටස ඇතුළත් කිරීම.

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ VIIIඅ කොටස වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"VIIIඅ කොටස

**අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීම**

ලියාපදිංචි සහතිකයක් නොමැතිව අලාභ ගැලපුම්කරුවකු ලෙස ක්‍රියා කිරීමට එරෙහිව වූ තහනම.

89අ. (1) මේ පනත යටතේ මණ්ඩලය විසින් නිකුත් කරන ලද අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි සහතිකයක් දරන්නේ නම් මිස, කිසිම තැනැත්තකු විසින් යම් රක්ෂණකරුවකු වෙනුවෙන් අලාභ ගැලපුම්කරුවකු ලෙස ක්‍රියාකිරීම හෝ පෙනී සිටීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු නොවන සහ ඒ තැනැත්තා නේවාසිකව සිටින රටේ අලාභ ගැලපුම්කරුවකු ලෙස අදාළ බලධරයකුගෙන් අවශ්‍ය නීතිමය පිළිගැනීමක් ලබාගෙන ඇති තැනැත්තකුට, ශ්‍රී ලංකාව තුළ අලාභ ගැලපුම්කරුවකු ලෙස කර්තව්‍ය ඉටුකිරීමට අවසර තිබුණ ද, මේ පනතේ විධිවිධාන යටතේ අලාභ ගැලපුම්කරුවකු ලෙස ශ්‍රී ලංකාවේ නිසි ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තකු සමග ඒ කර්තව්‍යය කරගෙන යා යුතු ය.

ලියාපදිංචි කිරීම සඳහා වූ සුදුසුකම්.

89ආ. යම් තැනැත්තකු, මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා සාදන ලද රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් සුදුසුකම් සහ පළපුරුද්දක් දරන්නේ නම් මිස, කිසිම තැනැත්තකු මේ පනත යටතේ අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට සුදුසු නොවන්නේ ය.

ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම සහ සහතික නිකුත් කිරීම.

89ඇ. (1) අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා සලසනු ලබන පරිදි වූ යම් ආකෘතියකින් වූ ඉල්ලුම්පත්‍රයක් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා සාදන ලද රීති මගින් නිශ්චිත යම් ලේඛන, තොරතුරු සහ ගාස්තුවක් ද සමග එය ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් ලැබුණ විට මණ්ඩලය විසින්, එහි සඳහන් තොරතුරු සැලකිල්ලට ගනිමින් සහ අවශ්‍ය යයි හැඟී යන අවස්ථාවක ඉල්ලුම්කරුට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීමෙන් අනතුරුව, ඉල්ලුම්කරු අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වීමට සුදුසු ද නැතහොත් නුසුදුසු ද යන්න පිළිබඳව ලිඛිත දැන්වීමකින් ඔහුට දැනුම් දිය යුතු ය. අලාභ ගැලපුම්කරුවකු ලෙස යම් තැනැත්තකු ලියාපදිංචි කළ විටක, ලියාපදිංචි කිරීමේ සහතිකයක් එම තැනැත්තාට නිකුත් කරනු ලැබිය යුතු අතර, සහතිකයේ නිශ්චිතව සඳහන් කර ඇති ඇතැම් නියම හා කොන්දේසිවලට ද එම තැනැත්තා යටත් විය යුතු ය.

(3) මණ්ඩලය විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය මගින් ඒ සහතිකයේ නිශ්චිතව දක්වා ඇති ඇතැම් කටයුතු කරගෙන යාමට එය දරන්නාට බලය පවරනු ලබන අතර, එසේ නිකුත් කළ කිසිදු සහතිකයක් වෙනත් යම් තැනැත්තකුට පවරනු ලැබීමට හෝ වෙනත් යම් තැනැත්තකුගේ යහපත පිණිස භාවිත කරනු ලැබීම නොකළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකයක පැවරීමක් හෝ භාවිත කිරීමක් ශූන්‍ය සහ බලරහිත වන අතර, වහාම බලපැවැත්වෙන පරිදි ඒ ලියාපදිංචි කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීමට මණ්ඩලයට බලය ඇත්තේ ය.

(5) අලාභ ගැලපුම්කරුවකුට නිකුත් කළ යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක නිශ්චිතව සඳහන් කර ඇති කිසියම් නියමයකට හෝ කොන්දේසියකට යමක් එකතු කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ අලුත් නියමයන් හෝ කොන්දේසි එකතු කිරීම, මණ්ඩලය විසින් ඕනෑම අවස්ථාවක දී කරනු ලැබිය හැකි ය.

ලියාපදිංචිය අහෝසි කිරීම.

89ඇ. (1) යම් අලාභ ගැලපුම්කරුවකු—

(අ) මේ පනතේ මෙම කොටසේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ සාදන ලද රීති හෝ නියෝග කිසිවක් උල්ලංඝනය කර ඇති බවට ;

(ආ) මණ්ඩලය විසින් මෙම පනත යටතේ නිකුත් කළ ලියාපදිංචි කිරීමේ සහතිකයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් නියමයක් හෝ කොන්දේසියක් කඩවන ආකාරයෙන් ක්‍රියා කර ඇති බවට ;

(ඇ) ඒ අලාභ ගැලපුම්කරු විසින් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද කිසියම් ඉල්ලීමක, ගිණුමක, ලිඛිත තොරතුරක හෝ ලේඛනයක කර ඇති යම් ප්‍රකාශයක්, සාවද්‍ය, දෝෂ සහිත හෝ නොමග යවනසුලු බවට පසුව සොයා ගනු ලැබූ විට හෝ අලාභ ගැලපුම්කරුවකු වීම සඳහා ඔහුට ඇති යෝග්‍යතාවය තක්සේරු කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ තීරණයට බලපානු ලැබිය හැකි යම් වැදගත් කරුණු වසන්කර හෝ අනාවරණය කිරීමට අපොහොසත් වී ඇති බවට ; හෝ

(ඈ) ලියාපදිංචි කිරීමේ සහතිකය ප්‍රදානය කිරීමෙන් අනතුරුව, එසේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ප්‍රදානය කිරීම සඳහා නුසුදුස්සකු වී ඇති බවට,

මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක දී, මණ්ඩලය විසින් අලාභ ගැලපුම්කරුවකුට නිකුත් කළ ලියාපදිංචි කිරීමේ සහතිකය අහෝසි කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය දුන් තීරණයකින් අතෘප්තියට පත්වන අලාභ ගැලපුම්කරුවකු විසින් ඒ පිළිබඳව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, මේ පනතේ 19 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම අභියාචනය කෙරෙහි අදාළ කරගත යුතු ය.

ප්‍රතික්ෂේප කිරීමට පෙර මණ්ඩලය විසින් හේතු දැක්වීමට අවස්ථාවක් ලබාදිය යුතු බව.

89ඉ. (1) අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මේ පනතේ කරන ලද ඉල්ලීමක්, ඉල්ලුම්කරු වෙත යවන ලිඛිත දැන්වීමකින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කාලයක් තුළ දී, ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප නොකළ යුත්තේ මන්ද යන්න පිළිබඳව ඉල්ලුම්කරුට හේතු දැක්වීමේ අවස්ථාවක් ලබාදීමෙන් තොරව, මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප නොකළ යුතු ය,

(2) ලියාපදිංචිය සඳහා ඉදිරිපත් වන කිසියම් ඉල්ලුම්කරුවකු—

(අ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කළ දැන්වීමක නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ දී හේතු දැක්වීම පැහැරහරින ; හෝ

(ආ) මණ්ඩලයට පිළිගත හැකි ප්‍රමාණවත් හේතු දැක්වීමට අපොහොසත් වන,

අවස්ථාවක, ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.”.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය එහි “සමාගමක්” යන වචනය වෙනුවට ඒ වචනය යෙදෙන සෑම ස්ථානයකම “තැනැත්තකු” යන වචනය ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියට 92අ අලුත් වගන්තියක් ඇතුළත් කිරීම.

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 92අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"නිසි ලෙස ලියාපදිංචි වීමකින් තොරව අලාභ ගැලපුම්කරුවකු ලෙස කටයුතු කරගෙන යාම වරදක් බව.

92අ. මේ පනත යටතේ නිසි ලියාපදිංචි වීමකින් තොරව අලාභ ගැලපුම්කරුවකු ලෙස කටයුතු කරන හෝ පෙනී සිටින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස්දහසකට නොඅඩු දඩයකට හෝ එක් අවුරුද්දකට නොඅඩු කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය සංශෝධනය කිරීම.

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය "මේ පනත යටතේ සාදන ලද යම් රීතියක් ", යන වචන වෙනුවට "මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක්, රීතියක් හෝ කරනු ලැබූ නියමයක් හෝ මේ පනත යටතේ මණ්ඩලය විසින් පනවන ලද කොන්දේසියක් හෝ කරන ලද යම් නිශ්චය කිරීමක්'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කිරීම.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "තැනැත්තකු එහි ප්‍රධාන නිලධරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.", යන වචන වෙනුවට "තැනැත්තකු මණ්ඩලයේ අනුමතය ඇතිව එහි ප්‍රධාන නිලධරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් නුසුදුසුකම්, (1) වන උපවගන්තිය යටතේ ප්‍රධාන නිලධරයකු වශයෙන් සේවයේ නියුතු තැනැත්තකුට අදාළ වන්නා වූ නුසුදුසුකම්වලට සහ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.".

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 94අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියට 94අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ලියාපදිංචි කිරීම සඳහා භාරදෙන ලද ඉල්ලුම්පත්‍රයක විස්තරවල වෙනස්කිරීම් පිළිබඳව මණ්ඩලය වෙත දැනුම් දිය යුතු බව.

94අ. මේ පනතේ 14 වන වගන්තිය, 81 වන වගන්තිය හෝ 89ඇ වගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, රක්ෂණකරුවකු, තැරැව්කරුවකු හෝ අලාභ ගැලපුම්කරුවකු ලෙසින් ලියාපදිංචිවීම සඳහා තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක අඩංගු තොරතුරුවල හෝ විස්තරවල, එසේ ලියාපදිංචිවීමෙන් පසුව යම් වෙනස්වීමක් හෝ වෙනස් කිරීමක් සිදුවන අවස්ථාවක දී, ඒ වෙනස්වීම හෝ වෙනස් කිරීම පිළිබඳව සම්පූර්ණ සහතික කරන ලද සත්‍ය ප්‍රකාශයක්, මණ්ඩලයට ඉදිරිපත් කිරීම, අවස්ථාවෝචිත පරිදි, ඒ රක්ෂණකරුගේ හෝ තැරැව්කරුගේ හෝ අලාභ ගැලපුම්කරුගේ කාර්යය විය යුතු ය.".

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 95 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 95අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියට 95අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"මණ්ඩලය විසින් ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය වැඩි කිරීමට නියම කිරීම.

95අ. තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් රක්ෂණකරුවන්ගේ සහ තැරැව්කරුවන්ගේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය වැඩි කළ යුතු බවට නියම කිරීමට මණ්ඩලයට බලය ඇති අතර, අවස්ථාවෝචිත පරිදි, එවැනි නියමයකට අනුකූලවීම සෑම රක්ෂණකරුවකුගේම හා තැරැව්කරුවකුගේම වගකීම වන්නේ ය.".

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 96අ සහ 96ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියට 96අ සහ 96ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"මණ්ඩලය විසින් විධාන නිකුත් කිරීම.

96අ. රක්ෂණ ඔප්පු දරන්නන්ගේ සහ විභව්‍ය රක්ෂණ ඔප්පු දරන්නන්ගේ සම්බන්ධතාවය ආරක්ෂා කිරීමේ අරමුණින්, මණ්ඩලය විසින් රක්ෂණකරුවන්, තැරැව්කරුවන් සහ අලාභ ගැලපුම්කරුවන් වෙත

විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, එම විධානවලට අනුකූල වීම, අවස්ථාවෝචිත පරිදි, එවැනි සෑම රක්ෂණකරුවකු, තැරැව්කරුවකු සහ අලාභ ගැලපුම්කරුවකුගේම කාර්යය විය යුතු ය.

"කරන ලද නිශ්චය කිරීම වහාම දැනුම් දිය යුතු බව.

96ආ. අවස්ථාවෝචිත පරිදි, රක්ෂණකරුවන්ට, තැරැව්කරුවන්ට හෝ අලාභ ගැලපුම්කරුවන්ට අදාළ වන තත්කාර්යය සඳහා රීති මගින් සෑදිය යුතු යයි නියම කර නැති මණ්ඩලයේ යම් නිශ්චය කිරීමක්, එම නිශ්චය කිරීම කළ වහාම, අවස්ථාවෝචිත පරිදි එම නිශ්චය කිරීම අදාළ වන සෑම රක්ෂණකරුවන්ට, තැරැව්කරුවන්ට හෝ අලාභ ගැලපුම්කරුවන්ට ඒ පිළිබඳව දැනුම් දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වන වගන්තිය සංශෝධනය කිරීම.

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වන වගන්තියේ “රක්ෂණකරුවකු වෙත භාර දිය යුතු බවට”, යන වචන සහ “ඒ රක්ෂණකරු හෝ”, යන වචන වෙනුවට පිළිවෙළින් “රක්ෂණකරුවකු හෝ තැරැව්කරුවකු වෙත භාර දිය යුතු බවට” යන වචන සහ “ඒ රක්ෂණකරුගේ හෝ තැරැව්කරුගේ”, යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තිය සංශෝධනය කිරීම.

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ 98 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) “දීර්ඝකාලීන රක්ෂණ ඔප්පුවක් මත”, යන වචන වෙනුවට “දීර්ඝකාලීන රක්ෂණ ඔප්පුවක් හෝ සාමාන්‍ය රක්ෂණ ඔප්පුවක් මත” යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනේ “දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර ඔප්පු යටතේ උද්ගතවන” යන වචන වෙනුවට “දීර්ඝකාලීන හෝ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ඔප්පු යටතේ උද්ගත වන” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය සංශෝධනය කිරීම.

**43.** ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ “තැනැත්තන්ට රක්ෂණ ගිවිසුම්වලට ඇතුළත් වන ලෙස ආරාධනා කරන හෝ ඇතුළත් වන ලෙස අර්පණය කරන ලියවිල්ලක්

අදහස් වන අතර" යන වචන වෙනුවට සහ "තොරතුරු ඇතුළත් යම් ලියවිල්ලක් ද", යන වචන වෙනුවට පිළිවෙලින් "විද්‍යුත් මාධ්‍යයකින් කරනු ලබන ආරාධනයක් ද ඇතුළත් ව කවර හෝ මාධ්‍යයකින්, තැනැත්තන්ට රක්ෂණ ගිවිසුම්වලට ඇතුළත් වන ලෙස කරනු ලබන ආරාධනයක් හෝ එසේ ඇතුළත් වන ලෙස කරනු ලබන අර්පණයක් අදහස් වන අතර," සහ "යම් තොරතුරු ද" යන වචන ආදේශ කිරීමෙන්.

**44.** ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"බලපත්‍රය හෝ ලියාපදිංචිය දෙන ලද ව්‍යාපාර හැර වෙනත් යම් ව්‍යාපාරයක් කරගෙන යාම තහනම් කිරීම.

100. යම් රක්ෂණකරුවකු හෝ තැරැව්කරුවකු විසින්, රක්ෂණකරුවකු සම්බන්ධයෙන් වන විට නිශ්චිත රක්ෂණ ව්‍යාපාර පන්තිය හෝ අනුපන්තිය හෝ තැරැව්කරුවකු සම්බන්ධයෙන් වන විට රක්ෂණ ව්‍යාපාර පන්තිය හෝ වෙනුවෙන් මේ පනත යටතේ මණ්ඩලයෙන් ලබාගන්නා ලද බලපත්‍රයක් හෝ ලියාපදිංචි සහතිකයක් යටතේ කරගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාරයක් හැර වෙනත් රක්ෂණ ව්‍යාපාරයක්, මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව කරගෙන යනු නොලැබිය යුතු ය.".

**45.** ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "නිකුත් කරන ලද උපදේශනවලට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ වචන ඉවත්කොට ඒ වෙනුවට "අදාළ සැමවිටම පවරා ගැනීම්වලට හා ඒකාබද්ධ කිරීම්වලට අදාළව, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ සාදන ලද රීතිවලට අනුකූලව කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තිය සංශෝධනය කිරීම.

**46.** ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "රක්ෂණකරු විසින්" යන වචන වෙනුවට "ඒ රක්ෂණකරු විසින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කිරීම.

**47.** ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "රක්ෂණ නියෝජිත" යන අර්ථනිරූපණයේ "පුද්ගලයකු" යන වචනය වෙනුවට "තැනැත්තකු" යන වචනය ආදේශ කිරීමෙන් ;

(2) "රක්ෂණකරුවකු" යන යෙදුමේ අර්ථනිරූපණයේ "ලියාපදිංචි කරන ලද සමාගමක්" යන වචන වෙනුවට "ලියාපදිංචි කරන ලද තැනැත්තකු " යන වචන ආදේශ කිරීමෙන් ;

(3) "බලපත්‍රලත් වාණිජ බැංකුව" යන අර්ථනිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණයට ඇතුළත් කිරීමෙන් :—

" ''බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය" යන්නෙන්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම් පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් අදහස් වේ;";

(4) "පළාත්පාලන ආයතන ඇපය" යන යෙදුමේ අර්ථනිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණයට ඇතුළත් කිරීමෙන්:—

"අලාභ ගැලපුම්කරු" යන්නෙන්, රක්ෂණ හිමිකම් පෑමකදී උද්ගත වන අලාභ විමර්ශනය කිරීමේ සහ තක්සේරු කිරීමේ විශේෂිත දැනුමක් ඇති සහ මේ පනතේ විධිවිධාන යටතේ අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තකු අදහස් වේ ;";

(5) "සමාගම් රෙජිස්ට්‍රාර්වරයා " යන යෙදුම සහ ඊට අදාළ අර්ථනිරූපණය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණය ඇතුළත් කිරීමෙන් :—

"සමාගම් රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනතේ 471 වන වගන්තිය යටතේ සමාගම් රෙජිස්ට්‍රාර්-ජනරාල්වරයා වශයෙන් ක්‍රියා කිරීමට නමින් හෝ ධුරයෙන් පත් කරනු ලබන තැනැත්තකු අදහස් වන අතර, ඒ වගන්තිය යටතේ

පත් කරනු ලබන යම් නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු හෝ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු ද ඊට ඇතුළත් වේ ;"; සහ

(6) "ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව" යන යෙදුමේ අර්ථනිරූපණයේ "ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව" යන වචන ආදේශ කිරීමෙන්.

**48.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය, ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය ලෙස නැවත අංකනය කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

**49.** ප්‍රධාන ප්‍රඥප්තියේ නැවත අංකනය කරන ලද පළමුවන උපලේඛනය අගට පහත දැක්වෙන අලුත් උපලේඛනය ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් උපලේඛනයක් එකතු කිරීම.

"දෙවන උපලේඛනය (31අ වගන්තිය)

**රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු වීම සඳහා ඇති නුසුදුසුකම්**

යම් තැනැත්තකු විසින් පහත සඳහන් නුසුදුසුකම් දරන්නේ නම් ඒ තැනැත්තා රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමට, තෝරා පත් කිරීමට හෝ නම් කිරීමට සුදුසු නොවන්නේ ය:—

(අ) රක්ෂණය, මූල්‍ය, ව්‍යාපාර පිළිබඳ හෝ වෙනත් යම් අදාළ ක්ෂේත්‍රයක අධ්‍යාපනික හෝ වෘත්තීයමය සුදුසුකම් නොදරන හෝ ඵලදායි පළපුරුද්දක් නොමැති වීම ;

(ආ) ඒ තැනැත්තා රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමට, තෝරා පත් කිරීමට හෝ නම් කිරීමට පෙරාතුව වූ වසර තුනක කාලය තුළ කවර හෝ කාලයක දී මණ්ඩලයේ සාමාජිකයකු හෝ සේවා නියුක්තිකයකු වශයෙන් කටයුතු කර ඇත්නම් ;

(ඇ) මූල්‍ය කළමනාකරණයට අදාළව සිදු කර ඇති අපරාධයක් සඳහා හෝ චරිත දූෂණයට අදාළ වන්නා වූ යම් වරදක් සඳහා ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් නිසි අධිකරණයක් මගින් වරදකරුවකු කරනු ලැබ ඇති විට ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ නිදහස නොලත් බංකොලොත්භාවයට පත් වූ හෝ වස්තු භංගත්වයට පත් වූ අයකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති විට ;

(ඉ) ණය මුදලක් ආපසු ගෙවීමට අදාළව ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් දෙන ලද යම් නඩු තීන්දුවක් හෝ නියෝගයක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී ඇති විට ;

(ඊ) ඒ තැනැත්තා සිහිවිකල තැනැත්තකු බවට ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් ප්‍රකාශයට පත් කර ඇති විට ;

(උ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී යම් රක්ෂණ සමාගමක තැරැව්කරුවකුගේ, බැංකුවක, මූල්‍ය ආයතනයක හෝ පුද්ගල මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු ලෙස, ප්‍රධාන විධායක නිලධරයකු ලෙස හෝ අධිකාරියේ වෙනත් යම් බලධාරී තත්ත්වයක සේවය කිරීම, නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක නියෝගයක් මගින් ඉවත් කරනු ලැබ ඇති විට හෝ අත්හිටුවනු ලැබ ඇති විට ; හෝ

(ඌ) ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී—

(i) රක්ෂණ සමාගමක හෝ තැරැව්කරුවකුගේ හෝ බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් ලෙස ක්‍රියා කිරීම සඳහා ප්‍රදානය කරනු ලැබ ඇති බලපත්‍රයක් හෝ වෙනත් අධිකාරී බලයක් අත්හිටුවා හෝ අවලංගු කර ඇත්තා වූ ; හෝ

(ii) ගණන් බේරා වසා ඇති හෝ ගණන් බේරා වසා දමනු ලබන හෝ අනිවාර්ය ඇවර කිරීමක් කරනු ලැබ ඇති,

යම් රක්ෂණ සමාගමක, තැරැව්කරුවකුගේ, බැංකුවක, මූල්‍ය ආයතනයක හෝ සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු , ප්‍රධාන නිලධරයකු, නිශ්චිත නිලධරයකු හෝ වෙනත් යම් වගකිවයුතු තනතුරක් දරන තැනැත්තකුව සිටින විට.”.

**50.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**51.** මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී, ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තිය යටතේ ලියාපදිංචි වූ යම් තැරැව්කරුවකුගේ පාලක සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයකු, රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු, කොටස් හිමියකු හෝ සේවා නියුක්තිකයකු වශයෙන් සිටින අවස්ථාවක, මේ පනතේ 28 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියට කරන ලද සංශෝධනය නොතකා, අවස්ථාවෝචිත පරිදි, දරනු ලබන කොටස් බැහැර කිරීම සඳහා හෝ එම අධ්‍යක්ෂ ධුරය හෝ සේවා නියුක්තිය අත්හැරීම සඳහා එම පාලක සමාගමේ අධ්‍යක්ෂවරයාට හෝ ප්‍රධාන විධායක නිලධරයාට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාධාරණ කාලසීමාවක් ලබා නොදී, එවැනි තැරැව්කරුවකු ගේ ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම නොකළ යුතු ය; නැතහොත් එම ලියාපදිංචිය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

ලියාපදිංචි තැරැව්කරුවන් විසින් එම තැරැව්කරුගේ පාලක සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයකු, රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයකු, කොටස් හිමියකු හෝ සේවානියුක්තිකයකු ලෙස තබා ගැනීම.

**52.** (1) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන සෑම රක්ෂණකරුවකු විසින් ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් වසර පහක කාලයක් ඇතුළත අවශ්‍ය අවස්ථාවන්හි දී මේ පනතේ 53 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති වෙන් කිරීමේ අවශ්‍යතාවය සපුරාලීමෙන් පසු 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකින් ලැයිස්තුගත කරනු ලැබිය යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.

බලපත්‍ර දරන රක්ෂණකරුවන් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය මගින් නියම කරන ලද පරිදි ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීම සිදු කරනු ලැබීමෙන් ඉක්බිතිව ම, ඒ කරුණ පිළිබඳව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙත නොපමාව ලිඛිතව දැනුම් දීම රක්ෂණකරුගේ කාර්යය වන්නේ ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන කිසිවකට එරෙහිව කුමක් සඳහන් වුව ද, මේ වගන්තිය මගින් පනවන ලද සෑම නියමයන්ටම අනුකූලවීමට රක්ෂණකරුවකු අපොහොසත් වීම, ඒ රක්ෂණකරු වෙත නිකුත් කරන ලද බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම සඳහා, හේතුවක් විය හැකි ය.

රක්ෂණකරුවන් විසින් ඔවුන්ගේ දීර්ඝකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වෙන් වෙන් වශයෙන් පවත්වාගෙන යා යුතු බව.

**53.** මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් මත දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයක් සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක් කරගෙන යනු ලබන රක්ෂණකරුවකු විසින්, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයෙන් වසර හතරක කාලයක් ඇතුළත, එම රක්ෂණකරු විසින් කරගෙන යනු ලබන දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය, වෙන් වෙන් සමාගම් දෙකක් වශයෙන් වෙන් කරනු ලැබීමට කටයුතු කරනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.